ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2023-01-09

පැමිණිලිකාරිය : කේ.ප්‍රේමලතා මිය,
මැද දංගස්වැව,
තන්තිරිමලය.

එච්.එච්.එස්.හිරාන් මදුශංඛ ජයරත්න - අතෘප්තියට පත් අය

වගඋත්තරකරුවන් :

01. පොලිස් සැරයන් 45741 ඩබ්ලිව්.එන්.විජේරත්න මයා,
පොලිස් ස්ථානය,
මහවිලච්චිය.

02. පොලිස් සැරයන් 34718 එම්.කේ.සිරිසෝමරත්න මයා,
පොලිස් ස්ථානය,
මහවිලච්චිය.

03. පොලිස් සැරයන් 31733 කේ.අබේවික්‍රම මයා,
පොලිස් ස්ථානය,
මහවිලච්චිය.

04. පොලිස් කොස්තාපල් 54301 එච්.ඒ.සී.හෙට්ටිආරච්චි මයා,
පොලිස් ස්ථානය,
මහවිලච්චිය.

05. පොලිස් කොස්තාපල් 63336 චමින්ද මයා,
පොලිස් ස්ථානය,
මහවිලච්චිය.

පැමිණිලි අංකය : HRC /AP/514/2014/(I)

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම පුතා වන කළුආරච්චිගේ හිරාන් මධුශංඛ ජයරත්න යන අය 2014.08.24 වන



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

දින පේමඩුව සිට නිවසට එමින් සිටියදී පේමඩුව ප්‍රදේශයේ ස්ථානයක බීමත්ව සිටි තරුණයන් දෙපිරිසක් අතර බහින්බස් වීමක් සිදු වී ඇති බවත් , එම ස්ථානයට තම පුතාද ගොස් ඇති බවත් , එහිදී තම පුතාට එම ස්ථානයේ සිටි පිරිසක් පහර දී ඇති බවත් ය. පසුව එම ස්ථානයට පොලිස් නිලධාරීන් දෙදෙනෙකු පැමිණ ඇති අතර, තම පුතාට මාංචු දමා පොලීසිය වෙත රැගෙන ගොස් ඇති බවත්, ඔහුව පොලීසියට රැගෙන යන අතරතුරදී පොලිස් නිලධාරීන් පුතාට පහර දී ඇති බවත් දක්වා ඇත. එමෙන්ම පොලීසියට රැගෙන ගිය පසුවද තම පුතාට පොලිස් නිලධාරීන් අමානුෂික ලෙස වධහිංසා කර ඇති බවද දක්වා ඇත.

**අතෘප්තියට පත් අයගේ ප්‍රකාශය :-**

අගතියට පත් කළුආරච්චිගේ හිරාන් මධුශංඛ යන අය විසින් ප්‍රකාශ කර ඇත්තේ, 2014.08.24 දින කරාටේ පුහුණුවීම් නිමකර නිවසට යමින් සිටියදී පේමඩුව හන්දියේදී පිරිසක් තම යහළුවෙකුට පහරදෙනු දුටු බවත්, යහළුවා බේරීමට ගිය අවස්ථාවේදී එහි සිටි අයෙක් තම කම්මුලට පහර කිහිපයක් ගැසූ බවත්, පසුව තම අත් දෙකට මාංචු දමන ලද බවත්ය. ප්සුව පොලීසිය වෙත රැගෙන ගොස් පොලීසිය තුළදී වරින්වර තමන්ට අමානුෂික ලෙස පහර දුන් බවත්ය. අනතුරුව තමන්ට එරෙහිව ගරු අධිකරණයේ නඩුවක් පවරන ලද බවත් දක්වා ඇත.

**ස්ථානාධිපතිවරයාගේ කරුණු දැක්වීම :-**

2014.09.20 දිනැති වාර්තාව කොමිසම වෙත යොමුකරමින් මහවිලච්චිය පොලීසියේ ස්ථානාධිපති විසින් දන්වා ඇත්තේ, පේමඩුව නගරයේ පිරිසක් බීමත්ව කලහකර ගන්නා බවට ලද තොරතුරක් අනුව ස්ථානයට ගොස් පැමිණිලිකරු ඇතුළු තවත් අයෙකු අත්අඩංගුවට ගෙන ඇති බවයි. පැමිණිලිකාර හිරාන් මදුශංඛ 2014.08.24 දින පැය 14.30ට අත්අඩංගුවට ගත් බවත් , 2014.08.25 දින ගරු අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්, වගඋත්තරකරුවන් පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත් සඳහන් කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ :-**

2014.08.24 වන දින වසමේ විෂ මත්ද්‍රව්‍ය මෙහෙයුම් රාජකාරියේ යෙදී සිටියදී පේමඩුව හන්දියේ ජනතාවට අපහසුවන අන්දමින් බීමත්ව පරුෂ වචන කියමින් කෑ කෝ ගසමින් කලහකාරී ලෙස හැසිරීමෙන් පුද්ගලයින් දෙදෙනෙකු සිටින බවට තොරතුරක් ලද බවත් , ඒ අනුව අදාළ ස්ථානය වෙත ගිය බවත්, එහිදී පුද්ගලයන් දෙදෙනෙකු අප්‍රසන්නතාවයෙන් හැසිරෙමින් සිටි බවත් දක්වා ඇත. එහිදී පොලිස් නිලධාරීන් විසින් අදාළ පුද්ගලයින්ට ස්ථානයෙන් ඉවත්වන ලෙසට දැනුම්දුන් බවත් , එහිදී එක් අයෙකු පොලිස් නිලධාරියෙකු තල්ලු කළ බවත්, පසුව පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට යාමේ දී පුද්ගලයන් නීතියට අවනත නොවී පොලිස් නිලධාරීන් සමඟ පොර බදිමින් රාජකාරියට බාධා කරමින් හැසිරුණු බවත්, නිලධාරීන්ගෙන් මිදී පලා යෑමට උත්සාහ කළ බවත්, එහිදී ඇස්බැස්ටස් සෙවිලි තහඩු ගොඩක් මත වැටුණු බවත් සඳහන් කර ඇත. අනතුරුව අනෙක් පොලිස් නිලධාරීන්ගේ සහය ඇතිව මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගනු ලැබූ බවද පහරදීම ප්‍රතික්ෂේප කරන බවද දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

2014.08.24 වන දින පැය 14.30 ට හිරාන් මදුශංඛ ජයරත්න යන අය අත්අඩංගුවට ගෙන ඇති අතර, එම අය අංක 144/2014 යටතේ 2014.08.24 වන දින මහවිලච්චිය රෝහලේ වෛද්‍යවරයා වෙත යොමු කර ඇත. එසේම අංක 146/2014 දරණ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය මඟින් 2014.08.24 වන දින

වගඋත්තරකාර පොලිස් නිලධාරීන් දෙදෙනෙකු වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති බවද නිරීක්ෂණය වේ.

හිරාන් මදූශංඛ ජයරත්නට එරෙහිව 2014.08.25 වන දින පොලිස් නිලධාරීන් හට සාපරාධී බලහත්කාරයපෑම, අඩත්තේට්ටම් කිරීම සම්බන්ධයෙන් ගරු අධිකරණය වෙත 32545/2014 යටතේ අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති අතර පොලිස් නිලධාරියෙකු සමඟ පුද්ගලයෙකු ආරවුලක් ඇති කර ගත් බවට අදාළ ස්ථානයේ සිටි අයගෙන් වගඋත්තරකරුවන් විසින් දිවුරුම් ප්‍රකාශ ලබාගෙන ඇත.

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් සඳහන් කර ඇත්තේ, වගඋත්තරකරුවන් පැමිණිලිකරුට පහරදී වධහිංසා කර අත්අඩංගුවට ගැනීම හේතුවෙන් අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට වන අතර, වගඋත්තරකරුවන් සඳහන් කර ඇත්තේ, පේමඩුව නගරයේ බීමත්ව කලහකර ගන්නා ලද බවට ලද තොරතුරක් පරීක්ෂා කිරීමට ගිය අවස්ථාවේදී පැමිණිලිකරු ඇතුළු පිරිසක් වගඋත්තරකරුවන්ට සාපරාධී බලහත්කාරය පෑම හේතුකොටගෙන පැමිණිලිකරුව අත්අඩංගුවට ගනු ලැබූ බවයි. එසේම පැමිණිලිකරුට කිසිදු වධහිංසාවක් නොකළ බවත්, පැමිණිලිකරුගේ අයිතිවාසිකම් උල්ලංඝනය කර නොමැති බවත් දක්වා ඇත.

පැමිණිලිකරු හා අතෘප්තියට පත් අය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ඇති ලේඛන අනුව හිරාන් මදූශංඛ යන අය යුධ හමුදාවේ සේවය කරනු ලබන අයෙකු වන අතර, ඔහු නිවාඩු ලබා පැමිණ සිටි අවස්ථාවේදී 2014.08.24 වන දින සිලව්විය පේමඩුව හන්දියේ දෙපිරිසක් අතර ඇති වූ ආරවුලකට පැමිණිලිකරු මැදිහත් වී ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු මැදිහත් වී ඇති ආරවුලේ පොලිස් නිලධාරීන් සිට ඇති අතර , පැමිණිලිකරු පොලිස් නිලධාරීන් සමඟ කතාබහක් ඇතිකර ගැනීම හේතුකොට ගෙන පැමිණිලිකරුද අදාල ආරවුලේ පාර්ශ්වකරුවෙකු වී ඇති බව නිරීක්ෂණය වේ.

පාර්ශ්ව විසින් ඉදිරිපත් කර ඇති සාක්ෂි , ලේඛන හා උධෘත අනුවද පැමිණිලිකරු පොලිස් නිලධාරීන් සමඟ ආරවුලකට පැටලී ඇති බව පැහැදිලිව නිරීක්ෂණය වේ.

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු හා තවත් අයෙකු අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇත.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසු මහවිලච්චිය රෝහලේ වෛද්‍යවරයා විසින් හිරාන් මදූශංඛ යන අය මත්පැන් බී වෙරි වී ඇති බවටත් , ඔහුගේ ශරීරයේ බරපතල නොවන අපවර්ථන පවතින බවටත් වෛද්‍ය මතය ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු 2014.08.25 වන දින පොලිස් නිලධාරීන්ට සාපරාධී බලහත්කාරය පෑම , අඩත්තේට්ටම් කිරීම සම්බන්ධයෙන් ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. නමුත් බීමත්ව සාපරාධී බලහත්කාරය පෑම සිදුකර ඇති බවට කරුණු ඉදිරිපත් කර නැත.

පාර්ශව විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත්කර ඇති සමස්ත කරුණු විමසා බැලීමේ දී පැමිණිලිකාර හිරාන් මදූශංඛ යන අය දෙපාර්ශවයක් අතර පැවති ආරවුලකට මැදිහත් වී ඔහුද පාර්ශව සමඟ ආරවුලක් ඇති කර ගනිමින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වන අතර, අදාළ ආරවුලේ පොලිස් නිලධාරීන්

පාර්ශවකරුවන්ව සිට ඇති බැවින් පොලිස් නිලධාරීන්ට සාපරාධී බලහත්කාරයපෑම , අධත්තේට්ටම් කිරීම යන චෝදනා අනුව පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීම සිදුව ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් හේතුවෙන් පැමිණිලිකරුගේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්චේදයේ 13(1) හි සඳහන් අයිතිවාසිකම් උල්ලංඝනය වී නොමැති බව නිරීක්ෂණය කරමි.

අභාප්තියට පත් හිරාන් මදුශංඛ යන අය අත්අඩංගුවට පත් වීමෙන් පසු වගඋත්තරකරුවන් විසින් අමානුෂික අන්දමින් පහරදී වධහිංසා කළ බවට පැමිණිලිකාරිය හා පැමිණිල්ලේ සාක්ෂි වශයෙන් ජේ.ඒ පුෂ්පා කුමාරි, අසිත අබේසේකර, ඉසුරු සම්පත්, යන අය විසින් සාක්ෂි ඉදිරිපත් කර ඇත.

හිරාන් මදුශංඛ යන අය 2014.08.24 දින අත්අඩංගුවට ගෙන 2014.08.25 දින ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ඔහුව බන්ධනාගාරගත කර ඇත.ඒ අනුව පැමිණිලිකරු 2014.08.26 දින පහරදීම සම්බන්ධව බන්ධනාගාර රෝහලෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබාගෙන ඇති අතර , බන්ධනාගාර රෝහලේ වෛද්‍යවරයාගේ වෛද්‍ය මතය ලබා දී ඇත. එය පහත පරිදි වේ.

01. Abrasion (අපමර්ෂණය) + (1)(L) wrist (මැණික්කටුව)
(2)(R) Under Finger at (දබර ඇඟිල්ල) 𝑅

02. (R) Ear (කණ) –Normal (සාමාන්‍ය තත්වය)
03. (L) Black Eye(හානි වූ ඇස) + CVS, Abd, CNS } NAN
NO H/NO dislocate (විස්තාපනය නොමැත)
NO other injuries (වෙනත් තුවාල නොමැත)

පැමිණිලිකරු 2014.08.27 වන දින බන්ධනාගාරයෙන් නිදහස්ව ඇති අතර , 2014.08.28 වන දින සිදු වූ පහරදීම සම්බන්ධයෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහල්ගතව ඇති බවත්, 2014.09.02 වන දින පැමිණිලිකරු අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් පරීක්ෂණයකට භාජනය කර ඇති බවත් නිරීක්ෂණය වේ. පැමිණිලිකරු විසින් වෛද්‍යවරයා වෙත ප්‍රකාශ කර ඇත්තේ , '2014.08.24 වන දින පොලිසියට ගෙනිහින් පොල්ලකින් සහ සපත්තුවලින් අත් කකුල්වලට ඔළුවට ගැහුවා' යනුවෙනි.

<u>Injuries</u>

01. Contusion 4x2cm in size situated over the lateral aspect of right mid arm. (දකුණු අතෙහි මැද කොටසෙහි පැත්තක 4x2cm ක ප්‍රමාණයේ තැල්මක්)

02. Two abrasion 1x0.5 cm in size situated over the dorsal aspect of right middle and index finger. (දකුණු අතෙහි මැද ඇඟිල්ලේ සහ දබර ඇඟිල්ලේ පෘෂ්ඨීය ප්‍රෙද්ශයේ 1x0.5 cm ප්‍රමාණයේ අපමර්ෂණ දෙකක්)

03. Abrasion 8x6 cm in size situated over the posterior aspect of wrist joint. (මැණික් කටුවෙහි පිටුපස ප්‍රෙද්ශයේ 8x6 cm ක ප්‍රමාණයේ අපමර්ශනයක්)

04. Left ear drum perforation 5%-10%. (වම් කණෙහි 5%-10%. ක සිදුරු වීමක්

05. Fracture nasal bone. (නාස් පොල්ලෙහි බිඳුමක්)

## Conclusion and opinion

The injuries No.01,02,03 and 04 can be classified as non-grievous.
The injuries No 05 can be classified as grievous under the limb (g) of section 311 of penal code.

අධිකරණ වෛද්‍ය නිලධාරීගේ 2014.08.30 දිනැති අධිකරණ වාර්තාවේ The age and the nature of the injuries were compatible with the history given by the examinee ලෙස සටහන් කොට ඇත.

ඒ අනුව රෝගී ඉතිහාසය සමඟ රෝගියාගේ තුවාල සැසඳෙන බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුට පහරදෙමින් වධහිංසා කරන ලද්දේ පොලිස් සැරයන් 45741 විජේරත්න, පොලිස් සැරයන් 34718 සිරිසෝමරත්න, පොලිස් සැරයන් 31733 අබේවික්‍රම, කොස්තාපල් 54301 හෙට්ටිආරච්චි හා කොස්තාපල් 63366 වමින්ද යන පොලිස් නිලධාරීන් බව ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල මඟින් ඔහුට පහර දුන් ආකාරය හා තුවාල සිදු වූ ආකාරය දක්වා ඇත. එසේම පැමිණිලිකරු ගරු අධිකරණයේ නියෝග මත බන්ධනාගාරයට ඇතුළු වූ පසු ඔහුට සිදු වූ පහරදීම සම්බන්ධයෙන් බන්ධනාගාර රෝහලෙන් ප්‍රතිකාර ලබා ගෙන ඇති අතර, එම වෛද්‍ය වාර්තාව මඟින් පැමිණිලිකරුගේ ශරීරයේ පැවති තුවාල දක්වා ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු බන්ධනාගාරයෙන් නිදහස් වූ වහාම වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුළත්ව ඇති අතර , අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් පරීක්ෂණ කර වෛද්‍ය වාර්තාව ලබා දී ඇත. එම වෛද්‍ය වාර්තාව මඟින් රෝගියා විසින් ලබා දී ඇති රෝග ඉතිහාසය සමඟ රෝග සැසඳෙන බවට වෛද්‍ය මතය ලබා දී ඇති බවද නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් සියළු දෙනා පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කර ඇති අතර, ඔවුන් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට යාමේදී ඔහු වගඋත්තරකරුවන් සමඟ පොරබදින ලද බවත්, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී කලහකාරී ලෙස හැසිරෙමින් අත්අඩංගුවට ගැනීමට බාධාකළ බවත්, මහත් පරිශ්‍රමයක් යොදා අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීමේදී ඔහු කිහිප අවස්ථාවකදී බිම ඇද වැටුණු බවත්, ඔහුගේ ශරීරයේ තුවාල සිදු වූ බවට නිරීක්ෂණය කළ හැකි බවත්ය.

මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව 2014.08.24 වන දින පැය 17.10 ට විලච්චිය රෝහලේ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය නිකුත් වී ඇති අතර, එම අධිකරණ පරීක්ෂණ පෝරමය අනුව පැමිණිලිකරුගේ ශරීරයේ අපවර්ශන පවතින බවටත්, අපවර්ශන බරපතල නොවන බවටත්, වෛද්‍යවරයා වෛද්‍ය මතය ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

එසේම මෙම පැමිණිලිකරුව පැය 18.45 ට උප සේවයට භාරදී ඇති බව නිරීක්ෂණය වන අතර, පිටතින් පෙනෙන තුවාල කිසිවක් නොමැති බවට සටහන් යොදමින් උපසේවයට භාරගෙන ඇති බව උධෘත අනුව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන්ගේ තර්කය වන්නේ මෙම පැමිණිලිකරු සම්බන්ධයෙන් ලැබී ඇති වෛද්‍ය වාර්තාවන්හි සඳහන් තුවාල සිදුවන්නට ඇත්තේ පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට යාමේදී ඔහු වගඋත්තරකරුවන් සමඟ පොර බැදීම, බිම ඇදවැටීම ආදී පැමිණිලිකරුගේ ක්‍රියාවන් හේතුවෙන් බවය. මෙම කරුණු තහවුරු කිරීම සඳහා අදාළ සිදුවීම සිදුවූ ස්ථානයේ සිටි පුද්ගලයින් කිහිපදෙනෙකුගේ සාක්ෂි කොමිසම වෙත ඉදිරිපත් කර ඇති අතර, මෙම සාක්ෂි අනුව පැමිණිලිකරු වගඋත්තරකරුවන් සමඟ පොර බැදීමක් සිදුව ඇති බවටත්, බිම වැටීමක් සිදුව ඇති බවටත් නිරීක්ෂණය කරගත හැකිය.

මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව ස්ථානය වෙත රැගෙන ගිය පසු පොලිස් ස්ථානයේදී පැමිණිලිකරුට වගඋත්තරකරුවන් විසින් පහරදුන් බවට සනාථ කරන සාක්ෂි පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇත. එම සාක්ෂියේ සඳහන් කරුණු සලකා බැලීමේදී පැමිණිලිකරුගේ පැමිණිල්ල, අධිකරණ වෛද්‍ය නිලධාරීන්ගේ වෛද්‍ය වාර්තාව අතර සමාන සැසඳීමක් පවතින බව නිරීක්ෂණය කර ගත හැකිය.

එමෙන්ම පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා ස්ථානයේදී පැමිණිලිකරුට පහරදීම් සිදු වූ බවට සාක්ෂිද ලබා දී ඇති අතර , එම ස්ථානයේදී පැමිණිලිකරුට පහරදීමක් සිදුව ඇති බවට එම සාක්ෂි මඟින් සනාථ කර ඇත.

**නිගමනය :-**

පාර්ශව විසින් ඉදිරිපත් කර ඇති සියළු කරුණු සලකා බැලීමේදී පැමිණිලිකරු පොලිස් නිලධාරීන්ගේ ආරක්ෂාව භාරයේ සිටියදී වධහිංසාවට ලක්ව ඇති බවට පැමිණිලිකරුගේ පැමිණිල්ල, ඔහු විසින් ඉදිරිපත් කර ඇති පුද්ගල සාක්ෂි , බන්ධනාගාර රෝහලේ වෛද්‍යවරයාගේ වෛද්‍ය වාර්තාව හා අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව අනාවරණය වී ඇති බැවින් වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් හේතුවෙන් පැමිණිලිකරුගේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡෙදයේ 11 වන ව්‍යවස්ථාවෙහි සඳහන් කිසිම තැනැත්තෙකු වධහිංසාවලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටතේ නොකළ යුත්තේය යන අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡෙදයේ 11 වන ව්‍යවස්ථාවෙහි සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බැවින්, වගඋත්තරකාර පොලිස් සැරයන් 45741 විජේරත්න, පොලිස් සැරයන් 34718 සිරිසෝමරත්න, පොලිස් සැරයන් 31733 අබේවික්‍රම, කොස්තාපල් 54301 හෙට්ටිආරච්චි හා කොස්තාපල් 63366 චමින්ද යන පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත, ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත හා නීතිපතිවරයා වෙත යොමුකරනු ලැබේ.

2023.02.24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල

02. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

03. නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව,
අලුත්කඩේ, කොළඹ 12.

(01–03) ඉහත නිර්දේශය අනුව කටයුතු කිරීමට

04. මාං.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුර.

B/